*සැ. යු.* —2014.05.02 දින පළ වූ අංක 1861 දරන *ගැසට් පත්‍රයේ* III සහ IV(අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,862 - 2014 මැයි මස 09 වැනි සිකුරාදා - 2014.05.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I කොටස : (III) වැනි ඡෙදය - වෙළෙඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර පිළිබඳ දැන්වීම්

-

| | පිටුව |
|---|---|
| වෙළෙඳ ලකුණු පිළිබඳ දැන්වීම් … … | — |
| වෙළෙඳ ලකුණු පිළිබඳ නිවේදන … … | — |
| පේටන්ට් බලපත්‍ර පිළිබඳ නිවේදන … … | — |
| කාර්මික සැළසුම් පිළිබඳ නිවේදන … … | 170 |
| විවිධ දැන්වීම් … … | — |

**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන්, ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලි ව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 මැයි මස 30 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 මැයි මස 16 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක් නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය, හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (*වැ.බ.*)

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

169 -B 80836—307 (2014/05)
C1-

# පේටන්ට් බලපත්‍ර පිළිබඳ නිවේදන

## වෙළෙඳ ලකුණු පිළිබඳ කාර්යාලය

වෙළෙඳ ලකුණුවලට අදාළ සියලු ම ලියුම් කියුම් කොළඹ 10, ඩී. ආර්. විජයවර්ධන මාවතේ අංක 400, "සමාගම් මැදුරේ" 3 වැනි මහලේ පේටන්ට් බලපත්‍ර සහ වෙළෙඳ ලකුණු ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ පේටන්ට් බලපත්‍ර සහ වෙළෙඳ ලකුණු රෙජිස්ට්‍රාර් වෙත එවිය යුතු ය.

## පරීක්ෂා කිරීමේ වේලාවන්

සතියේ සෑම ක්‍රියාකාරී දිනක ම පෙරවරු 9.00 සිට පස්වරු 3.30 දක්වා ලේඛන පරීක්ෂා කිරීම සඳහා මහජනයා වෙනුවෙන් කාර්යාලය විවෘත කර තබනු ලැබේ. පරීක්ෂා කිරීම සඳහා ඉල්ලුම්පත්‍ර සතියේ වැඩ කරන දිනවල පස්වරු 2.00 දක්වා පමණක් භාරගනු ලැබේ.

## වර්ණවලට සීමාවූ වෙළෙඳ ලකුණු

ලියාපදිංචි කරනු ලැබීමෙන් පසු වෙළෙඳ ලකුණක් යම් යම් වර්ණයකට සීමා කරනු ලබන බවට ඉල්ලුම් පත්‍රයක් පිළිබඳ දැන්වීමක සඳහන් වී ඇති කල්හි ඒ සමග ඉදිරිපත් කරනු ලබන වෙළඳ ලකුණේ ලාංඡනයෙහි හැකි තරම් දුරට එම වර්ණයන් සාමාන්‍යයෙන් ප්‍රචාරය වන අන්දමට දක්වනු ලැබේ.

## ආශ්‍රිත කිරීම

මෙහි පළ කර ඇති ලකුණක් , 1979 අංක 32 දරන බුද්ධිමය දේපළ නීති සංග්‍රහ පනතේ 112 වැනි වගන්තිය යටතේ, තවත් ලකුණක් හා ආශ්‍රිත කොට භාවිතා කරනු ලබන බවට සඳහන් කර ඇති කල්හි එම වෙළෙඳ ලකුණට දී ඇති අංකය ද දක්වනු ලැබේ.

## විරෝධතා දැක්වීම

පහත සඳහන් වෙළෙඳ සේවා හෝ සාමූහික ලකුණු ලියාපදිංචි කිරීම ගැන විරෝධතාවය දැක්වීමට හේතු ඇති යම් කෙනෙකු මෙම *ගැසට් නිවේදනයේ* දින සිට තුන් මාසයක් ඇතුළත ඇම් 2 දරන ආකෘති පත්‍රය (අනු පිටපතකින් ද යුක්තව) මගින් විරෝධතා දැක්වීම ඉදිරිපත් කළ යුතු ය. එබඳු විරෝධතා දැක්වීමක් සඳහා ගාස්තුව රු. 750ක් වන අතර එම ගාස්තුව මුදලින්, චෙක්පතකින්, මුදල් ඇණවුමකින්, තැපැල් ඇණවුමකින් හෝ බැංකු අණකරයකින් ගෙවිය යුතු ය.

# කාර්මික සැලසුම් පිළිබඳ නිවේදන

**2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත**

(79 (2) (ආ) වගන්තිය)

මෙම නිවේදනය පළ කිරීමෙන් මාස 3ක් ඉකුත් වීමෙන් පසුව පහත සඳහන් ඉල්ලුම්කරුවන්ට පේටන්ට් බලපත්‍ර ලබා දීමට හැකි බව මහජනතාවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| (1) ඉල්ලුම්පත්‍ර අංකය: 15970; | (2) ඉල්ලුම්කරු: අධ්‍යක්ෂ පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය; | (3) | නව නිර්මාණයේ නම: ලොකු ළූණු එම ගෙඩිවල විශාලත්වය අනුව කාණ්ඩවලට වෙන් කිරීමේ යන්ත්‍රයේ සැලසුම හා වැඩි දියුණු කිරීමේ යන්ත්‍රය; |
| (1) ඉල්ලුම්පත්‍ර අංකය: 16424; | (2) ඉල්ලුම්කරු: බක්මීගේ නිශාන්ත කුමාර; | (3) | නව නිර්මාණයේ නම : නව තිර මුද්‍රණ ක්‍රමවේදය; |
| (1) ඉල්ලුම්පත්‍ර අංකය: 16458; | (2) ඉල්ලුම්කරු: වීරසිංහ මුදියන්සේලාගේ ගුණසේකර; | (3) | නව නිර්මාණයේ නම : බහු කාර්ය බීජ වපුරන යන්ත්‍රය; |
| (1) ඉල්ලුම්පත්‍ර අංකය: 16903; | (2) ඉල්ලුම්කරු: අධ්‍යක්ෂ, පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය; | (3) | නව නිර්මාණයේ නම : වියලන ලද ගම්මිරිස් සඳහා වාෂ්පජනක ජීවානුහරණ යන්ත්‍රය; |
| (1) ඉල්ලුම්පත්‍ර අංකය: 16904; | (2) ඉල්ලුම්කරු: අධ්‍යක්ෂ, පශ්චාත් අස්වැන්න පිළිබඳ තාක්ෂණ ආයතනය; | (3) | නව නිර්මාණයේ නම : අඛණ්ඩ වී වාෂ්ප ජනක යන්ත්‍රය; |
| (1) ඉල්ලුම්පත්‍ර අංකය: 17102; | (2) ඉල්ලුම්කරු: ආර්. එස්. ඒ. ප්‍රියදර්ශනී ජේ. එම්. ආර්. එස්. බණ්ඩාර, පර්ලා ජාත්‍යන්තර ආයතනය, ඕවර්සීස් ඔන්ලුස්; | (3) | නව නිර්මාණයේ නම : ද්‍රව්‍යමය ජීව පොහොර මාධ්‍ය; |

| | | | | | |
|---|---|---|---|---|---|
| (1) | ඉල්ලුම්පත්‍ර අංකය: 17199; | (2) | ඉල්ලුම්කරු: රාජගුරු මුදියන්සේලාගේ සෙනජිත් බණ්ඩාර හුණුකුඹුර ; | (3) | නව නිර්මාණයේ නම : යාන්ත්‍රිකව පොල් අත්තේ ඉරටු වෙන් කරන යන්ත්‍රය; |
| (1) | ඉල්ලුම්පත්‍ර අංකය: 17251; | (2) | ඉල්ලුම්කරු: සරත් උදයසිරි දම්පගේ; | (3) | නව නිර්මාණයේ නම : පරිගණක ජාලකරණයේ ෆෝවර්ඩ් හැන්ඩ්ඕවර් ක්‍රමවේදය සඳහා වූ වැඩි දියුණු කිරීම; |
| (1) | ඉල්ලුම්පත්‍ර අංකය: 17257; | (2) | ඉල්ලුම්කරු: බෙනට් උපාලි සිරිමාන්න; | (3) | නව නිර්මාණයේ නම : අවහිර නොවන සොරොව් බේසම; |

05 - 99

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.